ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

## ශ්‍රී ගුරු නානක් දේවතුමාගේ 550 වන ජන්ම දිනය කොළඹදී සැමරේ

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ගුරු නානක් දේවතුමාගේ 550 වන ජන්ම දිනය 2019 නොවැම්බර් මස 9 වන දින සමරනු ලැබීය.

ශ්‍රී ගුරු නානක් දේවතුමා ප්‍රථම ගුරු වන අතර ලොව ලාබාලතම ආගම් අතරින් එකක් වන සික් ධර්මයේ නිර්මාතෘවරයා වේ. සියලු ආකාර සහ නාම ඉක්මවූ සර්වඥ, සර්වබලධාරී, සර්වව්‍යාපී එකම දෙවියෙකු පිළිබඳ දේශනා කළ එතුමා කවියෙකු, ආගමික ගුරුවරයෙකු, සමාජ සංශෝධකයකු සහ ගෘහමූලිකයෙකු විය. එතුමාගේ "සියලු මනුෂ්‍යයන් සමානය" යන සංකල්පය කුලය, ආගම, ජාතිය, වර්ණය හෝ මූල්‍ය තත්වය මත පදනම් වූ බෙදීම් වලට එරෙහි සමාජ දර්ශනයකට මග පෑදීය.

සික් දහම පහළොස්වන සියවසේ අග භාගයේදී සහ දහසය වන සියවසේ මුල් භාගයේදී ඉන්දියානු උප මහද්වීපයේ වයඹදිග ප්‍රදේශයේදී උපත ලැබූ අතර මේ වනවිට සික් භක්තිකයන් මිලියන 30 ක් පමණ ලොව පුරා පැතිරී සිටී. එය සංවිධානය වූ ආගම් අතරින් ලොව පස්වෙනුවට විශාලතම ආගම වන අතර සමස්තයක් වශයෙන් ලොව නවවෙනුවට විශාලතම ආගම වේ. සික් දහම එහි පළමු ගුරු වන ගුරු නානක්තුමාගේ ආධ්‍යාත්මික ඉගැන්වීම මත පදනම් වන අතර එතුමාගෙන් පසුව සික් ගුරුන් නව දෙනෙකු සිට ඇත. දහ වන ගුරු වන ගුරු ගෝබින්ද් සිං තුමා මිනිස් ගුරුන්ගේ සම්ප්‍රදාය අවසාන කරමින් "ගුරු ග්‍රාන්ත් සහීබ්" ශුද්ධ ග්‍රන්ථය සික්වරුන්ගේ සදාකාලික, ආගමික

ආධ්‍යාත්මික මගපෙන්වීම බවට පත් කරමින් එතුමාගේ අනුප්‍රාප්තිකයා ලෙස නම් කළේය. කර්තක් මාසයේ (ඔක්තෝබර් - නොවැම්බර්) පසළොස්වක දිනයේදී ගුරු නානක් දෙව්තුමාගේ උපත ලොව පුරා සමරනු ලැබේ.

ගුරු නානක්තුමා ඉන්දියානු උප මහද්වීපයේ සෑම තැනකමද බටහිර ආසියාවේද විශාල වශයෙන් සංචාරය කර ඇත. එතුමා **ශ්‍රී ලංකාවටද** පැමිණ ඇති බව සදහන්ය. එතුමාගේ ආධ්‍යාත්මික ගමන්වලදී හින්දු, ජෛන, බෞද්ධ, පර්සියානු සහ මුස්ලිම් වැනි විවිධ ආගම්හි පූජකවරුන් සමග සංවාද පැවැත්වීය. ඉවසීම උගන්වනු ලබන එකම දෙවියෙකු පිළිබඳ එතුමාගේ සංකල්පය තහවුරු කරන අනෙකුත් ආගම් සමග එතුමා සාකාච්ඡාවක නිරත විය. අනතුරුව එතුමා සමානාත්මතාවය, සහෝදර ප්‍රේමය, යහපත සහ සුචරිතය මත පදනම් වූ ආධ්‍යාත්මික, සාමාජීය සහ දේශපාලනමය සුවිශේෂී වේදිකාවක් නිර්මාණය කළේය.

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මෙම සුවිශේෂී දිනය සාකච්ඡා, වාර්තාමය වැඩසටහන් සහ කොළඹ, ශ්‍රී ගුරු නානක් දර්බාර් ගුරුද්වාරයේ ග්‍යානිතුමන්ලාගේ ආත්මීය දේශන සමගින් සමරනු ලැබීය.

ඉන්දියානු මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා මෙම අවස්ථාවට සහභාගී විය.

එසේම, "කර්තාර්පූර් කොරිඩෝව" විවෘත කිරීමද මෙම අවස්ථාව හා සමපාත විය.

*****

කොළඹ

2019 නොවැම්බර් 09